

(C) Sumitha Publishers

ලෝකය පටන් ගත්ත
කාලයේ ම මිනිස්සු
තමන්ට රජ කෙනෙකු පත් කරගත්තා.
ඒ තමයි මනු රජ්ජුරුවෝ. තිරිසන් සත්තු
සිංහයා තමන්ගේ රජතුමා වශයෙන් පත්
කරගත්තා. කුරුල්ලෝ තමන්ගේ රජ පත්
කරගැනීමට සිතා ගත්තා. සැළලිහිණියා හැම
තැනකට ම පියඹා ගොස් රජතුමා පත් කර
ගැනීමට සියලු කුරුල්ලන්ට එන්න කිව්වා.